


# මහරගම නගර සභාව හොරු - දූෂිතයො නැතිව පිරිසුදු කරන්න සහාය වෙන්න

## මහරගම නගර සභා අපේක්ෂක - **ළහිරු වාසනා ප්‍රිය** (ජාතික ජන බලවේගය)

**ඉෂාරා දේවින්දනී**



මහරගම නගර සභාව හොරුන්ගෙන්, දූෂිතයන්ගෙන් තොර වූ පිරිසුදු නගර සභාවක් බවට පත්කර ගන්නට සියලු දෙනාගේම සහාය අපේක්ෂා කරන බව ජාතික ජන බලවේගයෙන් මහරගම නගර සභාවට තලවතුගොඩ කොට්ඨාසයෙන් තරග කරන ළහිරු වාසනා ප්‍රිය මහතා පැවැසීය.

ඒ මහතා වැඩිදුරටත් මෙලෙස ද කීය.

"හඳ මිනිසුන්ට වටින්නේ එළිය විහිදුවනකල් විතරයි කියලා කතාවක් තියෙනවා. ඒ කතාව සාක්ෂාත් කර ගන්න නම් ඔබ සියලු දෙනාම ඒ එළිය විහිදුවන තැනට ගෙනයන්න අවශ්‍යයි. ඒ වෙනුවෙන් අපි ගම්මට්ටමින් සාමූහිකව එකතු වෙලා ඒ එළිය විහිදුවන තැනට ගෙනයද්දී, ඒ එළිය ඔබට දෙද්දී හැමදාම ඔබ අප ඒ එළිය මතකයේ තබා ගන්නවා. ඒ මතක මතු දවසක මේ රට මගේ දරුවන්ට, ඔබේ දරුවන්ට සතුටෙන් බැඳෙන්න වගේම අත්නොහැර යන රටක සාමූහිකත්වයෙන් ජීවත් වෙන්න පුළුවන් වාතාවරණයක් ගොඩනගාවි. එනිසා අපි ගම්මට්ටමින් එකතු වෙලා ගමේ දිරිය රටට දෙන්නයි මේ සූදානම් වෙන්නේ. ඒ සූදානමට එකතු වූ ඔබ සියලු දෙනාගේම සහයෝගය ජනාධිපතිවරණයේදී වගේම මහමැතිවරණයේදී ජාතික ජන බලවේගයට දුන්නා. ඒ වගේම මෙවර පළාත් පාලන මැතිවරණයේදී මහරගම නගර සභාව හොරුන්ගෙන් දූෂිතයන්ගෙන් තොර වූ පිරිසුදු නගර සභාවක් කරන්න ඔබේ සහාය ජාතික ජන බලවේගයට දෙන්න. එය ලැබෙන බව ස්ථිරයි."

# ගමේ සියලු ප්‍රශ්න විසඳන්න අපට මෙවර බලය දෙන්න

## හාරිස්පත්තුව ප්‍රා. සභා අපේක්ෂක - **පාඨලී මාරසිංහ** (ජාතික ජන බලවේගය)

**කටුගස්තොට සමූහ එස්.ජී. විජේරත්න**



මහනුවර දිස්ත්‍රික්කයේ තිබෙන විශාලම ප්‍රාදේශීය සභාව හාරිස්පත්තුව බවත්, මෙවර පළාත් පාලන මැතිවරණයෙන් ජාතික ජන බලවේගය ජයග්‍රහණය කර හාරිස්පත්තුවට විශාල වැඩ කොටසක් ඉටු කිරීමට තිබෙන බවත් හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ හල්ලොලුව කොට්ඨාසයේ ජාතික ජන බලවේග අපේක්ෂක ශ්‍රී ලංකා යුද හමුදාවේ විශ්‍රාමික මේජර් පාඨලී මාරසිංහ මහතා පැවසීය.

ඔහු වැඩිදුරටත් මෙසේද කීය.

"අද වන විට ප්‍රාදේශීය සභාව සතු මහා මාර්ග විශාල ලෙස අබලන් වීම නිසා ප්‍රදේශයේ ජනතාව දැඩි අපහසුතාවකට පත්ව සිටිනවා. එසේ අබලන්ව ඇති මාර්ග පද්ධතිය යථා තත්ත්වයට පත් කිරීමට පියවර ගන්නවා. හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවට ජාතික ජන බලවේගයෙන් කොට්ඨාස 22ම නියෝජනය කරමින් අපේක්ෂකයන් 22 දෙනකු ඉදිරිපත් වෙනවා. අපි විශ්වාස කරනවා ඒ 22 දෙදෙනාම ජයග්‍රහණය කරයි කියල. ජාතික ලැයිස්තුවෙන් තවත් සභිකයෝ 17ක් සභාවට පත්කර ගන්න ඕනෑ. ඉතින් අපේ ඒ කණ්ඩායම ලබන ජයග්‍රහණය හරහා හාරිස්පත්තුවට විශාල සේවාවක් අපට ඉටු කරන්න පුළුවන්. අපි බලයට පත්වුණාම ප්‍රාදේශීය සංවර්ධන කමිටුව හරහා මහනුවර දිස්ත්‍රික් සංවර්ධන කමිටුවට ප්‍රදේශයේ පවතින ගැටලු සම්බන්ධව කරුණු පැහැදිලි කර මේ ගැටලුවලට පිළියම් යොදනවා. අපි ජනාධිපතිවරණයත්, මහ මැතිවරණයත් විශිෂ්ට ලෙස ජයග්‍රහණය කරල තියෙන්නේ. එම නිසා ගමේ අඩුපාඩු සියල්ල ඉටු කරන්න මෙවර පළාත් පලාන මැතිවරණයේදී අපිට බලය ලබා දෙන්න කියා ප්‍රදේශවාසීන්ගෙන් ඉල්ලීමක් කරනවා"

# ඡන්දයට වටිනාකමක් එකතු කර ගන්න ප්‍රතිපත්තියක් ඇති අයට කතිරෙ ගහන්න

## **සසික දිසානායක** (ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ)

**උදාරා පාරමී**



'පළාත් පාලන මන්ත්‍රීවරයෙක් වශයෙන් ගියවර ද මම ගමට විශාල සේවයක් සිදු කළා. එමෙන්ම කොවිඩ් වසංගතය වැලඳුණු අවස්ථාවේදී ද ජනතාව වෙනුවෙන් පෙනී සිටියා. ඒ අවස්ථාවේදී සෑම නිවෙසකටම ගොස් අවශ්‍ය සියලු දේවල් සොයා බලමින් ජනතාවගේ සුබසිද්ධිය වෙනුවෙන් වැඩ කළා' යැයි කැලණිය ප්‍රාදේශීය සභාවේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ අපේක්ෂක සසික දිසානායක මහතා ප්‍රකාශ කළේය.

ඔහු වැඩිදුරටත් මෙසේද කීය.

"ප්‍රදේශයේ ඇති අබලන් මංමාවත්, කානු පද්ධති ප්‍රතිසංස්කරණය කිරීමට ද අප හට හැකි වුණා.

නමුත් නොසිතූ ලෙස ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පසුගිය වසර කිහිපයේදී දේශපාලනික වශයෙන් පසුබෑමකට ලක්වූ මොහොතක පවා වෙනත් පක්ෂ සමඟ එකතු නොවී, ඔවුන්ගේ වරදාන වරප්‍රසාදවලට යට නොවී ජය මෙන්ම පැරදුම ද සමසමව විඳ ගැනීමට හැකි ප්‍රතිපත්තිගරුක මිනිසුන් ලෙස අප කටයුතු කළා. මෙවරද පළාත් පාලන මැතිවරණයේදී ඔබේ වටිනා ඡන්දයට ඉහළ අගයක් හිමිකර ගැනීමට ගමේ උපන්, ගමේකම ඇති, පාට පක්ෂ භේද නැති, ගමේ සැමට හිතවත් අප හට ඔබගේ වටිනා ඡන්දය දීමට පොහොට්ටුව ඉදිරියේ කතිරය ලකුණු කර අපට කැලණිය ප්‍රාදේශීය සභාව නියෝජනය කිරීමට වරම් ලබාදෙන ලෙස ඔබ සැමගෙන් ළෙන්ගතුකමින් ඉල්ලා සිටිනවා. තවද ඊළඟ වර මෙන්ම ඉදිරියටත් ජනතාවගේ සුබසිද්ධිය වෙනුවෙන් වැඩ කිරීමට බලාපොරොත්තු වෙනවා."

# උකුවෙල නව සංවර්ධන ප්‍රවේශයකට ගෙනයනවා

## උකුවෙල ප්‍රා.සභා අපේක්ෂක **නිලන්ත දසනායක** (පොදුජන එක්සත් පෙරමුණ)

**නිපුනි ශාරදා**



මෙවර පොදුජන එක්සත් පෙරමුණු කණ්ඩායම උකුවෙල කලාපය පිළිබඳ මනා දැනීමක් ඇති කණ්ඩායමක් ලෙස කටයුතු කරන බව, උකුවෙල ප්‍රාදේශීය සභාව සඳහා රයිතලාවෙල කොට්ඨාසයෙන් ඉදිරිපත් වන පොදුජන එක්සත් පෙරමුණු අපේක්ෂක නිලන්ත දසනායක මහතා පැවසීය.

ඒ මහතා වැඩිදුරටත් මෙසේද කීය.

"ජනතාවගේ පොදු සුබසාධන කටයුතු කිරීමේදී මහජන කාර්යභාරයන් පසුගිය කාලයේදී ඉටු වී නොමැති බැවින් ගමේ සංවර්ධන කටයුතු සොයා බලමින් ඒ සඳහා විධිමත් සැලසුමක් ඉදිරිපත් කළ හැකි කණ්ඩායමක් මෙවර පොදුජන එක්සත් පෙරමුණෙන් ඉදිරිපත් වෙනවා. ඒ නිසා උකුවෙල කලාපය නව සංවර්ධන ප්‍රවේශයකට ගෙනයෑමට අපි කටයුතු කරනවා. ගෘහ ආර්ථිකය සවිමත් කිරීමට විශාල වශයෙන් කෘෂිකාර්මික කටයුතුවල නිරත වන පිරිසක් උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ජීවත් වෙනවා. ඔවුන්ට අවශ්‍ය, පළාත් පාලන ආයතනයකින් ඉටුවිය යුතු සමස්ත ප්‍රතිපත්ති සම්පාදනය සඳහා මෙවර අපේ කණ්ඩායම සැදී පැහැදී ඉන්නවා."

# බලය තිබූ අයට වඩා වැඩක් බලය නැතිව අපි කළා

## මුල්ලේරියාව ප්‍රා. සභා අපේක්ෂක **දයාවංශ ජයලත්** (සමගි ජන බලවේගය)

**මුල්ලේරියාව - සිරිසේන ගමගේ**



"කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ පසුගිය කාලයේ ජ.වි.පෙ. මන්ත්‍රීවරු තුන්දෙනෙක් හිටියා. මම පහුගිය මැතිවරණයේදී පරාජය වුණත් ජනතාවට පහුගිය අවුරුදු පහ ඇතුළත මෙම කොට්ඨාසයට ලක්ෂ සියයක වැඩ කර තියෙනවා මරික්කාර් මන්ත්‍රීතුමාගේ ප්‍රතිපාදන යටතේ. ඒ තුන්දෙනා බලයේ ඉඳලත් කරපු වැඩවලට වඩා බලය නැති මම වැඩ පෙන්නලා තියෙනවා." යැයි කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවට සමගි ජන බලවේගයෙන් තරග කරන දයාවංශ ජයලත් මහතා පැවසීය.

ඔහු වැඩිදුරටත් මෙසේද කියා සිටියේය.

"අංගොඩ ප්‍රදේශයේ මාර්ග කිහිපයක් ගල් අතුරා සංවර්ධනය කිරීම, කැඩී ගිය මාර්ග පිළිසකර කිරීම, බෝක්කු පිළිසකර කිරීම ආදී වැඩ රාශියක්ම මම සිදු කළේ කොට්ඨාස සංවිධායකවරයකු වශයෙන් ඉඳලයි. ඊට අමතරව ඩෙංගු මර්දන කටයුතු, ගංවතුර විපත් අවස්ථාවලදී ඒ අයගේ අවශ්‍යතා ඉටු කිරීම ආදී කටයුතු මම සිදු කර තිබෙනවා. බලය ලැබුණොත් ඊටත් වඩා සේවයක් සිදු කිරීමට හැකියාව තිබෙනවා. අපි වැඩ කරන්න සූදානම්"

# ප්‍රාදේශීය සභා, මහජන නියෝජිතයන්ගේ දේපළ වෙන්න දෙන්නෙ නෑ

## මොනරාගල ප්‍රා. සභා අපේක්ෂක **ජනක කුරුප්පු** (ජාතික ජන බලවේගය)

**ඌව වෙල්ලස්ස විශේෂ ඩී.එස්. ගුණතිලක**



ප්‍රාදේශීය සභාවකින් මහජනතාවට සලසන සියලුම සේවාවන් අල්ලසින් තොර සුහදශීලී සේවාවක් යටතේ මොනරාගල ප්‍රදේශයට ලබාදෙන බව ජාතික ජන බලවේගයේ මොනරාගල ප්‍රාදේශීය සභා කණ්ඩායමේ නායක ජනක කුරුප්පු මහතා පැවසීය.

ඒ මහතා වැඩිදුරටත් මෙසේ ද පැවසීය.

"ප්‍රාදේශීය සභාව පසුගිය කාලවලදී ක්‍රියාත්මක වුණේ දූෂණයෙන් සහ අල්ලසෙන්. සභාව මහජන නියෝජිතයන්ගේ බූදලයක් බවට පත්ව ඔවුන් මුදල් උපයන ආයතනයක් බවට පත්වුණා. එම තත්ත්වය ජාතික ජන බලවේගයේ පාලනයක් යටතේ සම්පූර්ණයෙන්ම වෙනස් කර, සියලුම සේවාවන් අල්ලසෙන්, දූෂණයෙන් තොරව සුහදශීලී සේවාවන් ලෙස පවත්වාගෙන යෑමට කටයුතු කරනවා. දිස්ත්‍රික්කයේ ප්‍රධානතම නගරය මොනරගලයි. නමුත් ස්ථිර රථගාලක් නැහැ. බලප්‍රදේශය තුළ පිහිටි කාපට් කරන ලද මාර්ග සහ කොන්ක්‍රීට් කරන ලද මාර්ග නිසි නඩත්තුවක් නොමැති වීම නිසා විනාශ වෙමින් පවතිනවා. ඒ සඳහා නඩත්තු ඒකකයක් පිහිටුවීමට අපි කටයුතු කරනවා. ග්‍රාමීය මට්ටමේ සියලුම අතුරු මාර්ග පිළිසකර කරනවා. විශේෂයෙන් වතු මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගන්නවා. වසම් තුනකට එක බැගින් ප්‍රජා සෞඛ්‍ය මධ්‍යස්ථාන පිහිටුවනවා. නගරයේ කසළ ඉවත්කිරීම ක්‍රමවත් ලෙස සිදු කර කසළ ප්‍රතිචක්‍රිය කිරීමේ මධ්‍යස්ථාන වැඩිදියුණු කරනවා. ජනතාවගෙන් ලබා ගන්නා බදු මුදල්වලට අන්තිම සතය දක්වා වැඩි වටිනාකමක් දී ජනතාවගේ අවශ්‍යතාවන් ඉටු කරනවා. පසුගිය ජනාධිපතිවරණයයේදී සහ පාර්ලිමේන්තු මැතිවරණයේදී අති විශාල සහයෝගයක් ප්‍රදේශයේ ජනතාව ජාතික ජන බලවේගයට ලබා දුන්නා. ප්‍රාදේශීය සභා මැතිවරණයේදීත් එම සහයෝගය උපරිම මට්ටමෙන් ලබාදෙන බවටත් කිසිම සැකයක් නැහැ."

# මෙවර ගලේවෙල ප්‍රා. සභාවට එන්නේ ව්‍යවසායකයන් කණ්ඩායමක්

## ගලේවෙල ප්‍රා. සභා අපේක්ෂක **ශෂී මදුරප්පෙරුම** (සර්ව ජනබලය)



**තක්ෂිලා උදයංගනී**

ගලේවෙල ප්‍රාදේශීය සභාව තුළ ව්‍යවසායක සංකල්පයක් ස්ථාපනය කරමින් එහි ජනතාවගේ හෙට දවස වඩාත් සුරක්ෂිත කිරීම සඳහා කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව, ගලේවෙල ප්‍රාදේශීය සභාව සඳහා බේලියකන්ද, යටිගල්පොත්ත කොට්ඨාසය නියෝජනය කරන සර්ව ජනබලය පක්ෂයේ අපේක්ෂක ශෂී මදුරප්පෙරුම මහතා පැවසීය.

ඒ මහතා වැඩිදුරටත් මෙසේ ද සඳහන් කළේය.

"ගලේවෙල කියන්නේ ප්‍රධාන දිස්ත්‍රික්කයට අමතරව මැදිහත් වුණු නගරයක් විදිහට සංවර්ධනය වෙමින් පවතින නගරයක්. විශේෂයෙන්ම කෘෂිකාර්මික ආර්ථිකයක් පවතින නගරයක මේ වනවිට ජනතාව සඳහා ලැබිය යුතු වරප්‍රසාද සියල්ල කප්පාදු වෙමින් පවතිනවා. මහජන සේවා නිසි ලෙස ලැබෙන්නෙ නෑ. ඒ නිසා සර්ව ජනබලය යටතේ ව්‍යවසායක සංකල්පය ගලේවෙල තුළ ස්ථාපනය කරමින් ගලේවෙල ප්‍රාදේශීය සභාව සඳහා ව්‍යවසායකයන්ගෙන් සමන්විත වූ කණ්ඩායමක් සඳහා මෙවර බලය ලබා ගැනීමට කටයුතු කරනවා."

# පක්ෂ - පාට අමතක කර ගම හදන්න ඡන්දෙ දෙන්න

## කැලණිය ප්‍රා. සභා අපේක්ෂක **රොෂාන් පිටිපන** (එක්සත් ජාතික පක්ෂය)

**මලිඳු තෙන්නකෝන්**



2025 පළාත් පාලන මැතිවරණය මෙවර තීරණාත්මක මැතිවරණයක් බවත්, ගමට වැඩ කිරීමට ගමට ලැදි පුද්ගලයන් මෙවර ඡන්දදායකයන් විසින් තෝරාගත යුතු බවත්, මාධ්‍යවේදියකු වශයෙන් මෙවර කැලණිය ප්‍රාදේශීය සභාවට තරග කිරීමට තමා තීරණය කළේ, පසුගිය වකවානුවේ රට වැටී තිබුණු ඉතා අසීරු අවස්ථාවෙන් රට ගොඩගත් නායකයා සමඟ එකට සිටගනිමින් අලියා ලකුණින් බවත් කැලණිය ප්‍රාදේශීය සභා එක්සත් ජාතික පක්ෂ අපේක්ෂක රොෂාන් පිටිපන මහතා පැවසීය.

ඔහු වැඩිදුරටත් මෙසේද කීය.

"කවුරු අවලාද නැඟුවත්, චෝදනා කළත්, වසර 74ක ශාපයක් යැයි නන් දෙඩුවත් අපසු හැරී බැලූ කල මේ රටට විශාල සේවයක් එක්සත් ජාතික පක්ෂයෙන් සිදු වී ඇති බව ඉතිහාසය දන්නා ඕනෑම කෙනකු අවිවාදයෙන් යුතුව පිළිගන්නවා. 2021 වසරේදී රට ආර්ථික වශයෙන් අන්ත අඩියට වැටී බංකොලොත්භාවයට වැටුණු මොහොතේ රට භාරගෙන තනි මන්ත්‍රී කෙනකු වශයෙන් හිඳ ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා රට ගොඩගත් අයුරු පක්ෂ විපක්ෂ සැවොම පිළිගන්නා කාරණයක්. එම නායකයා සමඟ එකට සිට ගනිමින් ගමට සේවයක් කිරීම සඳහා මේ මැතිවරණ සටනට එක්වීමට මම තීරණය කළා. මා කැලණිය ශ්‍රී ධර්මාලෝක මහා විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා මාධ්‍යවේදියකු වශයෙන් ලේක්හවුස් ආයතනයට එක්වී රටට නිහඬ සේවයක් සිදු කළා. මෙම මැතිවරණය ගමට ඉතාමත් වැදගත් මැතිවරණයක්. මෙය ආණ්ඩු පෙරළන මැතිවරණයක්වත් පක්ෂ දිනවන මැතිවරණයක්වත් නොවෙයි. ගමට වැඩක් කරන අවංක, දක්ෂ පුද්ගලයන් තෝරා ගැනීමක්. එමඟින් විතරයි ගමේ අඩුපාඩු නිවැරදිව දන්නා නිවැරදි පුද්ගලයා කැලණිය ප්‍රාදේශීය සභාවට පත් කර ගත හැක්කේ. ගමට වැඩක් කර ගත හැක්කේ ගමට ආදරය කරන පුද්ගලයකුගෙන් පමණයි. ඒ නිසා ඔබ එක වරක් නොව, දෙවරක් සිතා, පක්ෂ පාට අමතක කර ගම හදන්න ඡන්දය දෙන්න."

# අපේ ලාභ ප්‍රයෝජනය නොතකා ජනතාව වෙනුවෙන් මූලිකත්වය ගන්නවා

## කොළඹ මහ නගර සභා අපේක්ෂක **ජනක චාමින්ද** (එක්සත් ජනරජ පෙරමුණ)

**දුලක්ෂි උඩගෙදර**



"කොළඹ මහ නගර සභාවෙන් වැඩක් කරගන්න ගියාම කොපමණ රස්තියාදුවක් වෙනවද කියල මම අමුතුවෙන් කියන්න ඕනේ නැහැ. ඒ ක්‍රමය වෙනස් කරලා ජනතාවට කඩිනම් විසඳුම් ලබාදෙන තැනට කොළඹ මහ නගර සභාව පත්කිරීමට මම සටන් කරනවා. ඒ වෙනුවෙන් ඔබ සැම මාව කොළඹ මහ නගර සභාවේ මන්ත්‍රීවරයෙක් ලෙස පත්කර ගනු ඇතැයි විශ්වාස කරනවා" යැයි කොළඹ මහා නගර සභා එක්සත් ජනරජ පෙරමුණු වනාතමුල්ල කොට්ඨාස අපේක්ෂක ජනක චාමින්ද මහතා පැවසීය.

ඔහු වැඩිදුරටත් මෙසේ ද කීය.

"වනාතමුල්ල ග්‍රාමයේ ජනතාව නිරන්තරයෙන් පීඩා විඳින ප්‍රශ්න, ගැටලු ගැන මට හොඳ අවබෝධයක් තියෙනවා. කොළඹ මහ නගර සභාවෙන් ලැබිය යුතු සේවාවන් නිසි ලෙස අපේ ගමේ ජනතාවට ලැබෙනව ද කියන ප්‍රශ්නය අදටත් තියෙනවා. මානුෂීය ප්‍රශ්න බොහෝමයක් ජනතාවට තිබෙනවා. ඒ ප්‍රශ්නවලට කිසිදු විසඳුමක් තවම ලැබිලා නැහැ. කොළඹ මහ නගර සභාවේ වැඩ කරගන්න ගියාම ගොඩක් අපහසුයි. ඒවාට කඩිනම් විසඳුම් ජනතාවට ලබා දීම තමයි මගේ බලාපොරොත්තුව. මම නගර සභාවට තරග කරන්නේ ඒ නිසයි. ජනතාවගේ ප්‍රශ්නවලට කඩිනම් විසඳුම් ලබා දීමට මම මාගේ ප්‍රමුඛතාව ලබා දෙනවා. මගේ පියාත් සක්‍රියව දේශපාලනමය වශයෙන් බොහෝ කටයුතු කළා. පියාගේ ආභාසයත් මා හට තිබෙනවා දේශපාලන සම්බන්ධව. මෙවර පළාත් පාලන මැතිවරණය ඉහළින් ජයග්‍රහණය කරලා මේ කොට්ඨාසය දිනවලා අපේ ලාභ ප්‍රයෝජනය නොතකා ජනතාව වෙනුවෙන් මූලිකත්වය ලබාදී වැඩ කිරීමට බලාපොරොත්තු වෙනවා."

# මම ඡන්දෙට ආපු එක මාලිමා ජයග්‍රහණයට අභියෝගයක්

## කුරුණෑගල මහ නගර සභා අපේක්ෂක - **සංජීව තන්ත්‍රීආරච්චි** (ශ්‍රී ලංකා මහජන පක්ෂය)

**කුරුණෑගල අතිරේක - පුෂ්පකුමාර ජයරත්න**



කුරුණෑගල මහ නගර සභාවේ ජයග්‍රහණය ලබා ගැනීමට මාලිමාව අසත්‍ය මත ජනතාව අතර පතුරුවමින් සිටින බව කුරුණෑගල මහ නගර සභාවට ශ්‍රී ලංකා මහජන පක්ෂය යටතේ තරග කරන අපේක්ෂක සංජීව තන්ත්‍රීආරච්චි මහතා ප්‍රකාශ කළේය.

ඔහු වැඩිදුරටත් මෙසේ ද කීය.

"මේ මැතිවරණයට ඉදිරිපත් වීම සඳහා ජාතික ජන බලවේගය කුරුණෑගල නාගරික බලප්‍රදේශයේ ඇතැම් කොට්ඨාස සඳහා අපේක්ෂකයන් පවා නම් නොකිරීම තුළින් ඔවුන්ට කුරුණෑගල මහ නගර සභාව, මෙවර පහසුවෙන් ජයග්‍රහණය කළ නොහැකි බව පෙනෙනවා. මම පදිංචිව සිටින කුරුණෑගල ජයන්තිපුර කොට්ඨාසයට මේ පාර කිසිම දේශපාලන පක්ෂයකින් අපේක්ෂකයකු ඉදිරිපත් කරලා තිබුණේ නැහැ. මම පසුගිය පාර්ලිමේන්තු මැතිවරණයට වෙනත් දේශපාලන පක්ෂයක් නියෝජනය කරමින් ඉදිරිපත් වීම නිසා කුරුණෑගල ජනතාව මා හොඳින් හඳුනනවා. ඒ නිසා එම ප්‍රදේශයේ ජනතාවගේ බලවත් ඉල්ලීම නිසාමයි මම මේ මැතිවරණයට ඔවුන්ම තෝරාදුන්න ශ්‍රී ලංකා මහජන පක්ෂය යටතේ ඉදිරිපත් වුණේ. ඒ ඉදිරිපත් වීම නිසාම මාලිමාවේ ජයග්‍රහණයට මම අභියෝගයක් බව තේරුම් ගත්තු නිසා ජනතාව අතර අප්‍රසාදයට පත් කිරීම සඳහා මම කුරුණෑගල හිටපු නගරාධිපති තුෂාර සංජීව විතාරණ මහතාගේ සම්බන්ධීකරණ ලේකම්වරයකු කියලා සමාජ මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය කරමින් සිටිනවා."

# මුස්ලිම් ගම්මානවල ප්‍රශ්න විසඳන්න මුස්ලිම් නියෝජිතයෝ වැඩිපුර යවන්න

## බියගම ප්‍රා. සභා අපේක්ෂක **එම්.එන්.එම්. ඉර්ෂාඩ්** (ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය)

**මල්වාන සමූහ මහානාම විතානගේ**



මුස්ලිම් ගම්මානවල පවතින පොදු ප්‍රශ්න හා ගැටලුවලට නිසි විසඳුම් ලබා ගැනීම සඳහා හඬක් නැඟීමට නම් මුස්ලිම් මහජන නියෝජිතයන් වැඩි වැඩියෙන් පළාත් පාලන ආයතනවලට පත්කර යැවිය යුතු බවත්, කවදත් මුස්ලිම් ජනතාව වෙනුවෙන් අවංකවම පෙනී සිටින ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ මන්ත්‍රීවරුන් වැඩි පිරිසක් මෙවර පළාත් පාලන ආයතනවලට පත්කර ගැනීමට මුස්ලිම් ජනතාව දැනට වඩා ඇපකැප වී කටයුතු කළ යුතු බවත් ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ බියගම ආසන ප්‍රධාන සංවිධායක හා බියගම ප්‍රාදේශීය සභා අපේක්ෂක, කණ්ඩායමේ නායක හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.එම්. ඉර්ෂාඩ් මහතා පැවසීය.

ඔහු වැඩිදුරටත් මෙසේ ද කීය.

"මෙවර පළාත් පාලන මැතිවරණයේදී මුස්ලිම් ජනතාව ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයට පූර්ණ සහාය ලබාදෙන්න ඕනෑ. එසේ සහාය දුන්නොත් තමයි අප පක්ෂයේ මුස්ලිම් මන්ත්‍රීවරුන් සංඛ්‍යාව වැඩිකර ගැනීමට හැකි වන්නේ. එවිට ඇතැම් පළාත් පාලන ආයතනවල බලය පිහිටුවීමේදී අප පක්ෂයේ ශක්තිය අපට සෙසු පක්ෂවලට පෙන්වන්නට හැකි වෙනවා. ඒ තුළින් මුස්ලිම් ජනතාවට බලපාන පොදු ප්‍රශ්න හා ගැටලුවලට නිසි විසඳුම් ලබා ගැනීමට ද අවස්ථාව ලැබෙනවා. අද මුස්ලිම් ජනතාවත් පළාත් පාලන ආයතනවලට වරිපනම් බදු ගෙවනවා. නමුත් තමන් ගෙවන එම වරිපනම් බදුවලට තම ප්‍රදේශවලට සේවාවක් ඉටු වෙනවාද කියන එක අද ප්‍රශ්නයක්. මේවා ගැන සොයා බලන්නට ඒ වගේම හඬක් නඟන්නට එම පළාත් පාලන ආයතනවල මුස්ලිම් නියෝජනයක් අවශ්‍යයි. ඒකයි මුස්ලිම් මන්ත්‍රීවරුන් පළාත් පාලන ආයතනවල සිටිය යුතුයි කියන්නේ. ඒ නිසා අපි මෙවර පළාත් පාලන මැතිවරණයට ගම ගැන මනා දැනුමක් තිබෙන, ගමට වැඩ කළ හැකි දක්ෂයන් පිරිසක් ඉදිරිපත් කර තිබෙනවා. ඔවුන් ගැන විශ්වාසය තබන ලෙසට අපි මුස්ලිම් ජනතාවගෙන් ඉල්ලා සිටිනවා."

2025 මැයි 01 බ්‍රහස්පතින්දා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.